ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
| දිනය | **2018 ජුනි මස 04 වැනි දින** |

## ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් විස්තීර්ණ ණය පහසුකම යටතේ එ.ජ. ඩොලර් මිලියන 252 ක පස්වැනි වාරිකය මුදාහැරීම

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි (ජා.මූ. අරමුදලෙහි) විධායක කමිටුව විසින් 2018 වසර සඳහා ශ්‍රී ලංකාව සමඟ පැවැත්වූ හතරවන වගන්තිය **(Article IV)** සම්බන්ධ සාකච්ඡා අවසන් කර, තුන් අවුරුදු විස්තීර්ණ ණය පහසුකමට අදාළ සිව්වැනි සමාලෝචනය සම්පූර්ණ කරන ලද අතර, ඒ අනුව විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) මිලියන 177.774 ක (දළ වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 252 ක) පස්වැනි වාරිකය මුදා හැරීම අනුමත කළේය. ශ්‍රී ලංකා රජයේ පුළුල් ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන සහ ගෙවුම් තුලනය සඳහා සහාය දැක්වීම විස්තීර්ණ ණය පහසුකමෙන් අරමුණු කෙරේ.

රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව, විචක්ෂණශීලී මුදල් ප්‍රතිපත්තිය සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ යන වඩා දියුණු ප්‍රතිපත්ති රාමුවක් තුළින් ආර්ථිකය ස්ථායී කිරීමට සහ ආර්ථික වර්ධනයට අනුබල දීමට බලධාරීන් විසින් දැරූ ප්‍රයත්න ජා.මූ. අරමුදල විසින් පිළිගෙන ඇත. නව දේශීය ආදායම් පනත බලාත්මක කිරීම, ස්වයංක්‍රීය ඉන්ධන මිල නියම කිරීමේ සූත්‍රය ක්‍රියාත්මක කිරීම සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය සඳහා ශ්‍රී ලංකා

මහ බැංකුවේ පෙර දැක්ම ඇතුළු ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණවල ප්‍රධාන කඩඉම් අත්කර ගැනීම පිළිබඳව ජා.මු. අරමුදල විසින් බලධාරීන්ව ඇගයීමට ලක්කර ඇති අතර ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ මෙම වේගය තවදුරටත් තිරසාරව පවත්වා ගැනීමේ වැදගත්කමද අවධාරණය කර ඇත.

මෙම පස්වන වාරිකය මුදා හැරීම සමඟ විස්තීර්ණ ණය පහසුකම යටතේ සිදු කළ සමස්ත මුදා හැරීම් ප්‍රමාණය වි.ගැ.හි. මිලියන 715.23 කට (දළ වශයෙන් එ.ජ.ඩොලර් මිලියන 1,014 කට) සමාන වේ. විස්තීර්ණ ණය පහසුකම අඛණ්ඩව ලැබීම මගින් බාහිර කම්පනයන්ට ඔරොත්තු දීමට ශ්‍රී ලංකාවට ඇති හැකියාව ශක්තිමත් කර ගැනීමටත්, සාර්ව ආර්ථික ස්ථායීතාව වර්ධනය කර ගැනීමටත් හැකි වන අතර, එමගින් මැදි කාලීන ආර්ථික වර්ධනය අත්කර ගැනීමට සහ වෙළඳපොළ විශ්වාසය ඉහළ නංවා ගැනීමට හැකි වනු ඇත.